රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2023-11-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad Programme) අවසන් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් අරමුදල් සපයා ගැනීම**

ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදල් මත ක්‍රියාත්මක කරන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (iRoad Programme) යටතේ වූ ඇතැම් මාර්ග සංවර්ධන ව්‍යාපෘති අරමුදල් නොලැබීම හේතුවෙන් අත්හිටුවා තිබේ. මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා පවත්වනු ලැබ ඇති අතර, එම ව්‍යාපෘතිය යටතේ කඩිනමින් නිම කළ යුතු සංරචකයන් නිම කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 60ක ණය මුදලක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟතාව පළ කර ඇත. ඒ අනුව, අදාළ ණය ගිවිසුමට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ජාලයන් (International Fair Trade Networks) අතර සහයෝගීතා රාමුවකට අත්සන් තැබීම**

ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ජාලයන් (International Fair Trade Networks) යනු ප්‍රමිතීන්, සහතික කිරීම, නිෂ්පාදක සහාය වැඩසටහන් සහ උපදේශනය හරහා ප්‍රතිලාභ සමානව බෙදාහරින ගෝලීය ජාලයක් වේ. ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳ කටයුතුවල නිරත ආයතන ගණනාවක් එම ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ජාලයේ හවුල්කරුවන් වශයෙන් කටයුතු කරනු ලබයි. යුරෝපා සංගමයේ "සාධාරණ වෙළෙඳාම" සහ "වෙළෙඳ යුක්තිය"ට සහාය දක්වන ප්‍රතිපත්ති සඳහා උපදේශනය ලබා දීම සහ යුරෝපා සංගමයේ ආයතන සමඟ අන්තර් ක්‍රියා කිරීමට හා අඛණ්ඩ සංවාදයක් පවත්වාගෙන යාම සඳහා එම ආයතනයට හැකියාව පවතී. ශ්‍රී ලංකාව තුළ "සාධාරණ වෙළෙඳාම සංකල්පය" ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ජාලයේ හවුල්කරුවන් සමඟ එක්ව ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යෝජනා කර ඇත. ඒ අනුව, ජාත්‍යන්තර සාධාරණ වෙළෙඳ ජාලයන් සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව ඉහළ නැංවීමේ අරමුණින් "සහයෝගීතා

163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

රාමුවකට" අත්සන් තැබීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. ශ්‍රී ලංකා රජය සහ නේපාල රජය අතර උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ සහයෝගීතාවන් සඳහා ගිවිසුමකට එළඹීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නේපාල රජය අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි අන්‍යෝන්‍ය සහයෝගිතාව ශක්තිමත් කිරීමේ, පුළුල් කිරීමේ හා දෙරටේ උසස් අධ්‍යාපන ආයතන අතර සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින්, උසස් අධ්‍යාපනික ක්ෂේත්‍රයේ සහයෝගීතාවන් සඳහා ගිවිසුමකට එළඹීමට යෝජනා වී ඇත. මෙම ගිවිසුම මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි ප්‍රගමනය සඳහා දෙරට අතර සිදු කෙරෙන පුහුණු වැඩසටහන් මෙන්ම උසස් අධ්‍යාපන ක්‍රමයට අදාළ විෂය මාලා සහ විද්‍යාත්මක හා අධ්‍යාපනික ක්‍රමවේද හුවමාරු කර ගැනීමටත්, දෙපාර්ශ්වය විසින් පවත්වනු ලබන උසස් අධ්‍යාපන සම්මේලන හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමටත් අවස්ථාව හිමිවේ. ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ නේපාල රජය අතර යෝජිත ගිවිසුම සඳහා අත්සන් තැබීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම**

කලාපීය රටවල් අතර සහයෝගීතාව පුළුල් කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානයක් 2014 වර්ෂයේදී නේපාලයේ කත්මන්ඩු නුවර පැවති සාර්ක් රාජ්‍ය නායකයින්ගේ 18 වැනි රැස්වීම් වාරයේදී යොමු වූ අතර, එය දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව බිහිවීමෙහිලා මූලික අඩිතාලම සපයා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙන්ම ශ්‍රම බලකායේ නිපුණතාවන් හඳුනාගැනීම සඳහා දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව කෙටුම්පත් කිරීම ලෝක කම්කරු සංවිධානයේ මැදිහත්වීම මත 2020 වර්ෂයේදී ආරම්භ කර තිබේ. ඒ සඳහා වන තාක්ෂණික කමිටු රැස්වීම්වලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාව ද ඇතුළුව සාමාජික රටවල අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ විසින්, කෙටුම්පත් කරනු ලැබ ඇති දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව සඳහා එකඟතාව පළ කර ඇත. මෙම දකුණු ආසියානු

සුදුසුකම් නිර්දේශන රාමුව තුළින් එක් එක් සාමාජික රටවල සුදුසුකම් රාමු සඳහා කිසිදු නෛතික බැඳීමක් සිදු නොවන අතර, කලාපයේ අනෙකුත් රටවල සුදුසුකම් රාමු වෙත යොමු කෙරෙන සබැඳියක් ලෙස ක්‍රියාත්මක වීම සිදු වේ. දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය සහ නීතිපතිගේ නිෂ්කාශනය ලබා දී ඇත. ඒ අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය එක්ව දකුණු ආසියානු සුදුසුකම් නිර්දේශන රාමුව ශ්‍රී ලංකාව තුළ බලාත්මක කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. කාබන් ශුද්ධ ශුන්‍ය මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලසුම - 2050

පැරිස් ගිවිසුමේ පාර්ශ්වකරුවෙකු වශයෙන් ශ්‍රී ලංකාව විසින් එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති යාවත්කාලීන ජාතිකව නිර්ණය කළ දායකත්ව මඟින් 2050 වර්ෂය වන විට කාබන් ශුද්ධ ශුන්‍ය තත්ත්වය ළඟා කර ගන්නා බවට එකඟතාව පළ කර ඇත. ඒ අනුව, එකී ඉලක්කයට ළඟා වීමට හැකි වන පරිදි අදාළ පාර්ශ්වකරුවන් සමඟ සිදු කරනු ලැබ ඇති පුළුල් උපදේශනයන් හරහා විශේෂඥ කණ්ඩායමක් විසින් 2050 වන විට කාබන් උදාසීන රටක් බවට පත්වීම පිණිස අවශ්‍ය වන හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සහ කාබන් තිර කිරීම වැඩි කිරීම සඳහා විභවයක් ඇති ක්‍රියාමාර්ග හඳුනාගෙන 2050 වර්ෂය වන විට කාබන් ශුද්ධ ශුන්‍ය මාර්ග සිතියම සහ උපායමාර්ග සැලැස්ම සකස් කරනු ලැබ ඇත. ඒ අනුව, එකී මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. පොලිඑතිලීන් ටෙරෙප්තලේට් (PET) සහ හයි ඉම්පැක්ට් පොලිස්ටිරීන් (HIPS) ප්ලාස්ටික් ඇසුරුම් සඳහා QR කේතයක් පදනම් කර ගත් තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කැඳවීම

ප්ලාස්ටික ඇසුරුම් වශයෙන් පාවිච්චි කරනු ලබන පොලිඑතිලීන් ටෙරෙප්තලේට් (PET) බෝතල් සහ හයි ඉම්පැක්ට් පොලිස්ටිරීන් (HIPS) කෝප්ප සහ අනෙකුත් ප්ලාස්ටික් බහාලුම් බොහෝ විට එක් වරක් පමණක් භාවිත කර පරිසරයට බැහැර කරනු ලබයි. එවැනි අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඇතැම් පාරිභෝගිකයින් විසින් වගකීම් විරහිතව කටයුතු කිරීමත්, කාර්යක්ෂම එකතු කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීමත්

හේතුවෙන් එකී ප්ලාස්ටික් අපද්‍රව්‍ය සංවේදී පරිසර පද්ධතින්ට ඇතුළුව බාහිර පරිසරයට එකතු වෙමින් පවතී. එම තත්ත්වය පාලනය කිරීමේ අරමුණින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා නියමු ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කර ඇත. නියමු ව්‍යාපෘති දෙකෙහි ප්‍රතිඵල මත හිස් බහාලුම් නැවත එකතු කර ගැනීමේදී තාවකාලික තැන්පතුව ආපසු ගෙවීමේ ක්‍රමවේදය යෝග්‍ය බවට හඳුනාගෙන තිබේ. එම ක්‍රමවේදය යටතේ පාරිභෝගිකයා විසින් අදාළ භාණ්ඩය මිල දී ගන්නා අවස්ථාවේදී විකුණුම්කරු තාවකාලික මුදල් තැන්පතුවක් ලබා ගන්නා අතර, හිස් බෝතලය/ඇසුරුම් ආපසු ලබා දුන් විට තාවකාලික තැන්පතුව පාරිභෝගිකයා වෙත ආපසු ලබා දීමට පියවර ගනු ලබයි. මෙම ක්‍රමවේදය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා QR කේත පද්ධතියක් හඳුන්වා දීම යෝග්‍ය බවට හඳුනා ගනු ලැබ ඇත. ඒ සඳහා සුදුසු ආයතන වෙතින් යෝජනා කැඳවීම සහ තෝරාගනු ලබන ආයතනය මඟින් QR කේතයක් පදනම් කර ගත් තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මඩුවන්වෙල නින්දගම වත්ත නැමති ඉඩමෙන් කොටසක් සීමාසහිත ලංකා දුම්කොළ සමාගම වෙත වන වගාව සඳහා බදු පදනම මත ලබා දීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනාමුර ග්‍රාම නිලධාරී වසමේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මඩුවන්වෙල නින්දගම වත්ත නැමති ඉඩමෙන් කොටසක් වන වගා ව්‍යාපෘතියක් සඳහා ලබා දෙන ලෙස සීමාසහිත ලංකා දුම්කොළ සමාගම විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එකී සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපෘති වාර්තාව ඇගයීමට ලක් කර ඇති අතර ඒ අනුව, මඩුවන්වෙල නින්දගම වත්ත නැමති ඉඩමෙන් අක්කර 87 රූඩ් 3 පර්චස් 25ක් සීමාසහිත ලංකා දුම්කොළ සමාගම වෙත වන වගා ව්‍යාපෘතියක් වෙනුවෙන් දීර්ඝකාලීන බදු පදනම මත වසර 30ක කාලයක් සඳහා ලබා දීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කරන ලද 1969 අංක 21 දරන පනත සංශෝධනය කිරීම**

මැනුම් හා සිතියම්ගත කිරීමේ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන පහසුකම් සලසනු ලබන ආයතනයක් වශයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය ස්ථාපනය කරන ලද 1969 අංක 21 දරන පනත සංශෝධනය කිරීමේ යෝග්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, උසස් පෙළ ගණිත අංශයෙන් මෙන්ම අනෙකුත් විෂය ධාරාවන්ගෙන් අධ්‍යාපනය හදාරා විශ්වවිද්‍යාලයට යාමට අවස්ථාව නොලබන සිසුන්ට මැනුම් හා සිතියම්ගත කිරීමේ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන අවශ්‍යතා නිර්මාණය කරමින් දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළට සරිලන ප්‍රායෝගික පුහුණුව සහිත උපාධිධාරීන් බිහි කිරීම යෝජිත සංශෝධන මගින් අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම**

විශේෂඥ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමට අදාළව පවතින විධිවිධාන සංශෝධනය කිරීම සඳහා 1927 අංක 26 දරන වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම පිණිස එවකට සෞඛ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව 2023-08-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලද අතර, එහිදී යෝජිත සංශෝධන පිළිබඳව තවදුරටත් කරුණු අධ්‍යයනය කර යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් වෙත යොමු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, එකී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ සඳහන් නිර්දේශ මත පදනම්ව වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**10. 2023 අංක 3 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර - තීරු බදු රහිත ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝග අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධාන යටතේ 2023 අංක 3 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර - තීරු බදු රහිත ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝග, අංක 2355/30 හා 2023-10-25 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. ශ්‍රී ලංකාව සහ කොරියානු සමූහාණ්ඩුව අතර දේශගුණ විපර්යාස සඳහා වන සහයෝගිතා ගිවිසුම**

දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් වන සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීමට ශ්‍රී ලංකාව සහ කොරියානු සමූහාණ්ඩුව අතර එකඟතාවකට එළඹ ඇත. ඒ අනුව, යෝජිත ගිවිසුමට අත්සන් තැබීමටත්, එකී ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ ඒකාබද්ධ කමිටුවක් පිහිටුවීමටත් පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**

ශ්‍රී ලංකාව නිරන්තර දේශගුණික විපර්යාසවල බලපෑමට ලක් වන රටක් වන අතර, එය දේශීය ආර්ථික වර්ධනයට බහුවිධ බලපෑම් ඇති කරනු ලබයි. තිරසර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් දේශගුණික විපර්යාසවලින් සිදු වන බලපෑම අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව රජය විසින් හඳුනාගනු ලැබ ඇත. එමෙන්ම, දේශගුණික අවදානම්, ජාතික ප්‍රමුඛතා, නව නැගී එන ගෝලීය වර්ධනයන්, දේශගුණයට අදාළ වැඩසටහන් යාන්ත්‍රණ සහ අරමුදල්වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2012 වර්ෂයේදී සකස් කරනු ලැබ ඇති ජාතික

දේශගුණික විපර්යාස ප්‍රතිපත්තියේ සැලකිය යුතු යාවත්කාලීන කිරීමක් ද අවශ්‍ය බව වැඩිදුරටත් හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, පරිසර අමාත්‍යාංශය විසින් අදාළ පාර්ශ්වයන්ගේ ද අදහස් විමසමින්, ජාතිකව නිර්ණය කළ දායකත්වයන්ට, දේශගුණ විපර්යාසවල බලපෑම සඳහා අනුහුරුවීමේ ජාතික සැලැස්මට, පැරිස් ගිවිසුමේ බැඳීම්වලට මෙන්ම එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට අනුකූල වන පරිදි යාවත්කාලීන කරනු ලැබ ඇති දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව, එකී ප්‍රතිපත්තියට අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

***********